Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

08 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 11 S I

බුද්ධ ධර්මය I, II | කාලය පැය දෙකයි

නම / විභාග අංකය

සැලකිය යුතුයි ★ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලමට පිළිතුරු සපයන්න.
★ 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට ඉතා නිවැරදි පිළිතුරු තෝරා එයට යටින් ඉරක් අඳින්න. (ලකුණු 2 x 20 ‸ 40)
★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
★ ප්‍රශ්න අංක 02 සිට 06 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු දපයන්න. (I) ඉ 2, (II) ඉ 3, (III) ඉ 5, ලෙස ලකුණු හිමි වේ.
★ හත්වන ප්‍රශ්නයට ලකුණු 5 බැගින් ලකුණු 10 ක් හිමිවේ.

බුද්ධ ධර්මය I

01) බුදු රජාණන් වහන්සේ , සුදු රෙදි කැල්ලක් අතට දී " රජෝහරණං රජෝහරණං " යනුවෙන් කියමින් රෙදි කඩ පිරි මදින්න යැයි ප්‍රකාශ කළේ,
i) දෙව්දත් තෙරුන්ට ය. ii) අංගුලිමාල තෙරුන්ට ය.
iii) චුල්ල පන්ථක තෙරුන්ට ය. iv) ආනන්ද තෙරුන්ට ය.

02) රාජ පූජිත සෝණදණ්ඩ නම් බමුණාගේ ප්‍රකාශය අනුව බුදු රජාණන් වහන්සේ " සම්මෝදකය ", එනම්
i) සතුටු සාමීචි කතා ඇත්තෙකි. ii) විවෘත කතා බහ ඇත්තෙකි.
iii) පළමුවෙන්ම කථා කරන්නෙකි. iv) කනට සුව එළවන කථා බහ ඇත්තෙකි.

03) " ගුරු බස සැබෑමය " යන පද්‍යය ඇතුළත් වන්නේ,
i) සුභාෂිතයේ ය. ii) සිරිත් මල්දමේය.
iii) ගුත්තිල කාව්‍යයේ ය. iv) ලෝවැඩ සඟරාවේය.

04) බුදු රජාණන් වහන්සේගෙන් පසුව බුදු සසුනේ ශාස්තෘවරයා ලෙස සැළකෙන්නේ,
i) ආනන්ද හිමියන් ය. ii) මහා කාශ්‍යප හිමියන් ය.
iii) සැරියුත් හිමියන් ය. iv) ධර්ම හා විනය යි.

05) පැරණි චාරිත්‍රයක් ලෙස රාත්‍රී කාලයෙහි සතිපට්ඨාන සූත්‍රය හෝ වෙස්සන්තර ජාතකය කියවූයේ,
i) අවමඟුල් අවස්ථාවක ය. ii) සරණ මංගල අවස්ථාවක ය.
iii) ගෘහ ප්‍රවේශ අවස්ථාවක ය. iv) අකුරු කියවන අවස්ථාවක ය.

06) තෙරුවන් ගුණ ඇතුළත් ගාථා සිහිපත් කරමින් මහමඟ ගමන් කරමින් සිටින විට සොරු කණ්ඩායමක් විසින් ඔහු මරණයට පත් කළත්, මරණින් පසු දෙව්ලොව ඉපදුණේ,
i) සුනීතය. ii) මට්ඨකුණ්ඩලීය. iii) සෝපාකය. iv) ඡත්ත මානවකයා ය.

07) සැරියුත් තෙරණුවෝ රහත් වූයේ බුදුරජාණන් වහන්සේ විසින් " දීඝනක " පිරිවැජියාට දේශනා කළ සූත්‍රයක් ඇසීමෙනි. එම සූත්‍රය නම්,
i) කරණීයමෙත්ත සූත්‍රය යි. ii) මහා මංගල සූත්‍රය යි.
iii) වේදනා පරිග්ගහ සූත්‍රය යි. iv) අනත්ත ලක්ඛණ සූත්‍රය යි.

08) ආනන්තර්ය පාප කර්මයට අයත් වන්නේ,
i) සතුන් මැරීමය. ii) පියා මැරීමය.
iii) කාමය වරදවා හැසිරීමය. iv) සුරාපානය කිරීමය.

09) චණ්ඩාශෝක රජතුමා ධර්මාශෝක මහ අධිරාජයාණන් බවට පරිවර්තනය කළේ කුඩා සාමණේරයන් වහන්සේ නමකගේ ඇවතුම් පැවතුම්ය. උන්වහන්සේ නම්,
i) නිග්‍රෝධ සාමණේරයන් ය. ii) සුමන සාමණේරයන් ය.
iii) සෝපාක සාමණේරයන් ය. iv) ධර්මරාම හිමියන් ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10) " ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ
විතින්න පරලෝකස්ස - නත්ථි පාපං අකාරියං " යන ගාථාවෙන් කියවෙන්නේ,
i) සතුන් මැරීම ගැනය. ii) සොරකම් කිරීම ගැනය.
iii) බොරු කීම ගැනය. iv) කේළාම් කීම ගැනය.

11) ජාතක කථා පන්සිය හතලිස් හතක් ඇතුළත් ග්‍රන්ථය වන පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියවුණේ,
i) අනුරාධපුර යුගයේ ය. ii) කුරුණෑගල යුගයේ ය.
iii) දඹදෙණි යුගයේ ය. iv) ගම්පළ යුගයේ ය.

12) කෝට්ටේ යුගයේ ලියවුණු කාව්‍යශේඛරය නම් මහා කාව්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
i) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය. ii) වීදාගම මෛත්‍රී හිමියන් ය.
iii) වෑත්තෑවේ හිමියන් ය. iv) අලගියවන්න මුකවැටි තුමාය.

13) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යනු,
i) දුක හඳුනා ගැනීමයි. ii) දුක නැති කිරීමයි.
iii) දුක නැති කිරීමේ මාර්ගය යි. iv) දුක ඇති වීමට හේතුවයි.

14) බුදු රජාණන් වහන්සේට වෛර කිරීමේ විපාක ලෙස බුදුන්වහන්සේ ජීවමානව සිටියදීම අවීචි මහානරකයට ගියේ,
i) මාගන්දියා ය. ii) චිඤ්චි මානවිකාව.
iii) දෙව්දත් තෙරුන් ය. iv) අක්කෝස භාරද්වාජ බමුණාය.

15) සතර සංග්‍රහ වස්තු හෙවත් සිව් සඟරාවත් වලට මේවායින් අයත් වන්නේ,
i) සිලය යි. ii) ප්‍රිය වචනය යි iii) භාවනාව යි. iv) පිං දීම යි.

16) බුදුරජාණන් වහන්සේ සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව තම ජීවිතයෙන් පෙන්වා දෙමින් පිරිනිවන් පා වදාළේ,
i) මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම් සල් උයනේදී ය. ii) ලුම්බිණි නම් සල් උයනේදී ය.
iii) අනුපිය නම් අඹ වනයේදී ය. iv) සීත වනයේදී ය.

17) පළමු ධර්ම සංගායනාවට සහභාගී වූ භික්ෂූන් වහන්සේලා ගණන වන්නේ,
i) පන්සිය නමකි. ii) දහස් නමකි. iii) හත්සිය නමකි. iv) එක් දහස් දෙසිය නමකි.

18) දළදා වහන්සේ පිළිබඳව ලියවුණ පැරණිම ග්‍රන්ථය වන්නේ,
i) පාලි දාඨා වංශය යි. ii) දළදා සිරිතයි. iii) දළදා පූජාවලිය යි. iv) දළදා වරුණයි.

19) නිතර නිතර රැස්වීම, සමඟව රැස්ව, සමඟිව සාකච්ඡාකොට, සමඟිව විසිරයාම වැනි කරුණු ඇතුළත් රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය වන්නේ,
i) දස සක්විති වත්ය. ii) දසරාජ ධර්මය.
iii) සප්ත අපරිහානිය ධර්මය. iv) සිව්බඹ විහරණය.

20) බුදු රජාණන් වහන්සේ , ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරක් ගැන දක්වන අනණ සූත්‍රය දේශනා කළේ,
i) කොසොල් මහා රජතුමාට ය. ii) බිම්බිසාර මහා රජතුමාට ය.
iii) බරණැස් සිටුතුමාට ය. iv) අනේ පිඬු සිටුතුමාට ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**සැළකිය යුතුයි**
**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01) ඔබ දුටු පිරිත් පින්කමක් ඇසුරු කොට ගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- i) පිරිත් පින්කමක දී මුලින්ම කළ යුතු චාරිත්‍ර 2 ක් ලියන්න.
- ii) පිරිත් දේශනාවට පෙර කළ යුතු කාර්යන් 3 ක් ලියන්න.
- iii) පිරිත් මණ්ඩපයේ එල්ලන ශාක හා මල් වර්ග 3 ක් ලියන්න.
- iv) එදින පන්සලේ සිට වැඩම කරවන පූජනීය වස්තු 2 ක් නම් කරන්න.
- v) භික්ෂූන් වහන්සේලා වැඩම කළ පසු මුලින්ම කරන චාරිත්‍ර 3 ක් ලියන්න.
- vi) පිරිතට ආරාධනා කරන ගාථාව ලියන්න.
- vii) සියලුම භික්ෂූන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් සජ්ඣායනා කරන පිරිත හඳුන්වන්නේ කුමන නමකින්ද නම් කරන්න.
- viii) අවසානයේ මහා සංඝරත්නය පරිභෝග කොට ආශිර්වාද කරමින් අපට ලබා දෙන දේවල් 2 ක් නම් කරන්න.

02)
- i) නව අරහාදි බුදු ගුණ වලින් 2 ක් නම් කරන්න.
- ii) එම ගුණ 2 ක කෙටියෙන් හඳුන්වා දෙන්න.
- iii) බුද්ධානුස්සති හෙවත් බුදු ගුණ භාවනාව වැඩීමෙන් මනස සන්සුන් කර ගෙන, ප්‍රබෝධවත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.

03)
- i) පළමු ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත් රහතන් වහන්සේ හා අනුග්‍රහය දැක් වූ රජු නම් කරන්න.
- ii) විනය පිටකයට අයත් ග්‍රන්ථ වලින් කොටස් තුනක් ලියා දක්වන්න.
- iii) වර්තමාන ගැටලු වලට විසඳුම් සාකච්ඡාවෙන් හා සම්මුතියෙන් ලබා ගත හැකි අයුරු පළමු සංගායනාව ඇසුරින් පෙන්වා දෙන්න.

04)
- i) " යෝච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති " යන ගාථාව සම්පූර්ණ කරන්න.
- ii) එම ගාථාවේ සරල අදහස ලියන්න.
- iii) ධම්ම පද ගාථා කීපයක් ආශ්‍රයෙන් ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට උපයෝගි කරගත හැකි අයුරු පැහැදිලි කරන්න.

05)
- i) සිතා මතා කරන ක්‍රියා හඳුන්වන නම කුමක්ද?
- ii) වචනයෙන් සිදුවන කුසල කර්ම 3 ක් ලියා දක්වන්න.
- iii) කුසල කර්ම හා අකුසල කර්ම කිරීමෙන් පුද්ගලයකුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වන අයුරු පැහැදිලි කරන්න.

06)
- i) ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරක් අනණ සූතයේ දැක්වේ. ඉන් දෙකක් නම් කරන්න.
- ii) එම එක් කරුණක් කෙටියෙන් හඳුන්වන්න.
- iii) ධාර්මික රැකියාවල නිරත වීමෙන් පුද්ගලයෙකුට ධාර්මික ජීවිතයක් ගත කළ හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

07) පහත සඳහන් මාතෘකා 2කට කෙටි සටහන් ලියන්න.
- i) සිගාලෝවාද සූත්‍රය.
- ii) දළදා වහන්සේ.
- iii) සැරියුත් තෙරණුවෝ.
- iv) සප්ත අපරිහානිය ධර්ම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2019

## බුද්ධ ධර්මය

08 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

බුද්ධ ධර්මය I

| | | | |
|---|---|---|---|
| 01) | III | 11) | II |
| 02) | I | 12) | I |
| 03) | II | 13) | IV |
| 04) | IV | 14) | III |
| 05) | I | 15) | II |
| 06) | IV | 16) | I |
| 07) | III | 17) | I |
| 08) | II | 18) | I |
| 09) | I | 19) | III |
| 10) | III | 20) | IV |

බුද්ධ ධර්මය II

01) i) ★ නිවසේ ස්වාමියා ගමේ විහාරස්ථානය කරා ගොස් දැහැත් වට්ටියක් පිරිනමා මහා සංඝරත්නයට ආරාධනා කිරීම.
★ නිවස අවට පිරිසිදු කිරීම.

ii) ★ පිරිත් මණ්ඩපය ඉදිකිරීම.
★ සතර දිශාවට දොරටු සතරක් තබා පුන්කලස් සකස් කිරීම.
★ ආසන 12 ක් සකස් කිරීම.
★ රාජගහ සකස් කිරීම.

iii) ★ පුවක් මල් කිණිති.
★ බුලත් කැන්.
★ නා දලු.
★ බෝ කොළ.

iv) ★ සධාතුක කරඬුව.
★ පිරුවානා පොත් වහන්සේ.

v) ★ පා දෝවනය කිරීම.
★ චතු මධුර සහිත දැහැත් ගිලන්පස බුද්ධ පූජාව පැවැත්වීම.
★ තුනුරුවන් වන්දනා කිරීම.
★ මහා සංඝරත්නයට ගිලන්පස පූජා කිරීම.
★ දැහැත් වට්ටියක් මහා සංඝරත්නයට පූජා කිරීම.

vi) " විපත්ති පටිභාහාය සබ්බ සම්පත්ති සිද්ධියා - සබ්බ දුක්ඛා විනාසාය පරිත්තං බ්‍රෑත මංගලං''
සිංහල තේරුම තිබුණොත් ලකුණු ලබාදෙන්න.

vii) ★ සෙත් පිරිත

viii) ★ පිරිත් පැන්, පිරිත් නූල්

02) i) අරහං , සම්මා , සම්බුද්ධෝ , විජ්ජාචරණ සම්පන්නෝ, සුගත , ලෝකවිදූ , අනුත්තරපුරිසදම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා.
ii) අරහං - සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක, සියලු පාපයන්ගෙන් මිදුණු සේක, සියලු ලෝවාසීන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු වූ සේක, එම නිසා අරහං නම් වන සේක. ආදී වශයෙන් 37, 38 පිටුවල සඳහන් කරුණු ඉදිරිපත් කොට තිබීම.
iii) ලියන ලද පිළිතුර බලා ලකුණු ලබා දෙන්න.

03) i) මූලිකත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ.
අනුග්‍රහය - අජාසත්ත රජතුමා.

ii) පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, චුල්ලවග්ග පාලි, මහාවග්ග පාලි, පරිවාර පාලි
iii) ලියන ලද පිළිතුර බලා ලකුණු ලබා දෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04) i) " යෝච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝ ව චන්දිමා

ii) යම් කෙනෙක් මුල දී පමා වුවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වලා ගැබින් මිදුණු පුන්සඳ මෙන් මේ මුළු ලෝකයම බබළවයි.

iii) ලියන ලද පිළිතුර බලා ලකුණු ලබා දෙන්න.

05) i) කර්මය නම් වේ.

ii) බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස්වචන කීම.

iii) තිදොරින් සිදුවන කුසල / අකුසල කර්ම වෙන් වශයෙන් ලියා කරුණු පැහැදිලි කොට තිබේ නම් පිළිතුර බලා ලකුණු දෙන්න.

06) i) අත්ථි සුඛ , භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ,

ii) පිළිතුර බලා ලකුණු ලබා දෙන්න. 134, 135, 136, 137, 138 යන පිටු බලන්න.

iii) ලියන ලද පිළිතුර බලා ලකුණු ලබා දෙන්න.

07) i) සිගාලෝවාද සූත්‍රය :- බුදු රජාණන් වහන්සේ විසින් සිගාල ගෘහපතියාට ලබා දුන් අවවාදය.

| | |
|---|---|
| පෙරදිග (නැගෙනහිර) | - දෙමාපියන් හා දූ දරුවන් |
| දකුණු දිශාව | - ගුරුවරු හා සිසුන් |
| අපරදිග ( බටහිර ) | - ස්වාමියා හා බිරිඳ |
| උතුරු දිශාව | - යහළුවන් |
| යට දිශාව | - ස්වාමියා හා සේවක |
| උඩ දිශාව | - ගිහි පැවිදි ආදී වශයෙන් සදිශාව පිළිබඳ පැහැදිලි කොට තිබේ නම් ලකුණු දෙන්න. |

ii) දළදා වහන්සේ :-
- ★ පාලි දාඨාවංශයෙහි සඳහන් මූලික තොරතුරු ලියා තැබීම.
- ★ ලංකාවට දළදා වහන්සේ වැඩම කරවීමේ තොරතුරු.
- ★ තැන්පත් කළ ස්ථාන
- ★ දළදා වහන්සේ පිළිබඳ ලියවුණු පොත පත.
- ★ දළදාව උදෙසා කරන පූජා පිළිබඳ විස්තර.
- ★ දළදාව උදෙසා කරන වාර්ෂික පූජා පිළිබඳ තොරතුරු ආදිය බලා ලකුණු ලබා දෙන්න.

iii) සැරියුත් මහ තෙරණුවෝ :- " අගසව් දෙනමගෙන් උගනිමු." මාතෘකාව යටතේ 41,42, 43, 44, 45, 46, යන පිටු බලා ලියන ලද තොරතුරු වලට අදාළව ලකුණු ලබා දෙන්න.

iv) සප්ත අපරිහානිය ධර්ම :- "පිරිහීම මඟ හරින අපරිහානීය ධර්ම" යන 21 පාඩමේ සඳහන් කරුණු හත ඉදිරිපත් කොට කෙටියෙන් පැහැදිලි කොට තිබේ නම් ලකුණු ලබා දෙන්න. 141, 142, 143, 144, පිටු බලන්න.